# පිත්තල කර්මාන්තය තුළින් හෙළිවන සිංහල සංස්කෘතියේ අනන්‍යතාව (උඩුනුවර කිරිවවුල, පමුණුව හා ගඩලාදෙණිය ප්‍රදේශ ආශ්‍රයෙන් සිදුකරන සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්)


**වසන්ත කේ. දිසානායක**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යමානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය,
සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, මිහින්තලේ
dwasanta@yahoo.com


## හැඳින්වීම

සිංහල සංස්කෘතියේ අනන්‍යතාව හෙළිකරන ඇතැම් අවිනෂ්ට ශේෂයන් ලෙස සැලකිය හැකි අතීත සිංහල වැඩවසම් සමාජ ක්‍රමයේ හායනීය අවස්ථාව නිරූපණයකරන සාම්ප්‍රදායික කර්මාන්ත තවමත් පැවතීම විමසිය යුත්තකි.කුලය මත පදනම් වූ පැරණි දේශීය සාම්ප්‍රදායික කර්මාන්ත රටාව හා බැඳි සංස්කෘතිය නිරූපණය කරන්නේ අතීත සිංහල සමාජ ක්‍රමයේ ස්වරූපයයි. මෙකී සාම්ප්‍රදායික කර්මාන්ත වටා ගොඩනැගුණු මානව සංස්කෘතියේ සාධනීය හා නිශේධනීය හැඩතලයන් වූ කලී සිංහල සංස්කෘතියේ අනන්‍යතාවයි.

සංස්කෘතික සංස්පර්ෂය,විසරණය හා සංක්‍රමණ හේතුවෙන් දිනෙන් දින සිදුවන සමාජ සංස්කෘතික විපර්යාස හමුවේ සිංහල සංස්කෘතියේ අවිනෂ්ට ශේෂයන් වූ උඩරට නවන්දන්නා කුලයේ පාරම්පරික පිත්තල කර්මාන්තය තුළින් හෙළිවන සිංහල සංස්කෘතියේ අනන්‍යතාව සමාජමානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනයට ලක්කිරීම කාලීන අවශ්‍යතාවකි.කොට්ටල් බද්ද යටතේ අතීතයේ රාජ්‍යසේවයේ නියුතු සාම්ප්‍රදායික කුලශ්‍රේණියක් වූ නවන්දන්නා කුලපරපුරේ නූතන ප්‍රවණතා,කුලය ඓහිකවීම,පිත්තල කර්මාන්තයේ ප්‍රභවය හා විකාශනය,ඒ හා බැඳි කාර්මික ශිල්පීය හා කලාත්මක ලක්ෂණ,පිත්තල කර්මාන්තය වටා ගොඩනැගුණු වාග්කෝෂය ආදී වූ තේමා ඔස්සේ විමර්ශනය කිරීම මෙහි අපේක්ෂාවයි

## පර්යේෂණ ක්ෂේත්‍රය

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වසම් 124න් 32ක පමණ නවන්දන්න කුලයට අයත් ශිල්පිහු පාරම්පරික පිත්තල කර්මාන්තයේ නියැලී සිටිති. මෙහිදී අපගේ අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස මූලික අවධානය යොමු වන්නේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨශයට අයත් මහා පරිමාණයෙන් පිත්තල කර්මාන්තයේ නිරත පාරම්පරික ශිල්පීන්ගෙන් සමන්විත කිරිවවුල, ගඩලාදෙණිය හා පමුණුව ප්‍රදේශ කෙරෙහිය.

වසම් හයකට අයත් තත් ප්‍රදේශ තුනෙහි ණිකිරිවවුල නැගෙනහිර තුළ පවුල් 55 ක් ද කිරිවවුල බටහිර පවුල් 50ක් ද පමුණුව නැගෙනහිර පවුල් 45 ක් ද පමුණු බටහිර පවුල් 50 ක්ද ගඩලාදෙණිය උතුර පවුල් 55 ක්ද ගඩලාදෙණිය දකුණ පවුල් 30 ක් ද ආශ්‍රයෙන් පාරම්පරික පිත්තල කර්මාන්තය පිළිබඳව තොරතුරු අධ්‍යයනය කෙරේ.

## පර්යේෂණ ගැටළුව

සිංහල සංස්කෘතියේ දේශීය අනන්‍යතාව මෙන්ම අතීත සමාජ සංස්කෘතියේ ස්වරූපය හෙළිකරන පිත්තල කර්මාන්තයේ වූ පාරම්පරික ශිල්පීය ඥානය, කලා නිපුණත්වය හා ඊටම ආවේණික වාග් කෝෂය අද්‍යතනයේ දී ශීඝ්‍රයෙන් වියැකෙමින් පවති. පාරම්පරික පිත්තල ශිල්පීන් අඩු ආදායම් ලබන පිරිසක් වීම, විකල්ප ජීවනෝපායන් කෙරෙහි නැඹුරුවීම,එමෙන්ම නවකයන් තම පාරම්පරික කර්මාන්තය කෙරෙහි දක්වන ආකල්ප හා නව සමාජය හා මුසුවීමේදී කුල ස්ථරායනය කෙරෙහි වත්මන් සිංහල සමාජයේ පවත්නා ආකල්පයද තත් කර්මාන්තයේ පිරිහීමට සාධකව පවතී

මෙකී ගැටළු හමුවේ වුවද පාරම්පරික පිත්තල කර්මාන්තයේ කලාත්මක සෞන්දර්යය හා ශිල්පීය ඥානය මෙන්ම සිංහල සංස්කෘතිය හා භාෂාව බැදි වාග්කෝෂය සමාජයෙන් වියැකීමට ප්‍රථම සංරක්ෂණය කිරීම කාලීන අවශ්‍යතාවකි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙකී පර්යේෂණය සඳහා දත්ත රැස්කිරීමේදී මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන ක්‍රමවේද විය. මූලික දත්ත සම්පාදනය ද්විතීයික මූලාශ්‍ර ඔස්සේ සිදුකළ අතර ප්‍රාථමික මූලාශ්‍ර තොරතුරු සහභාගීත්ව නිරීක්ෂණය හා සම්පත් දායකයින් සමඟ කළ සම්මුඛ සාකච්ඡා මගින් ලබාගැනීමට හැකිවිය. පර්යේෂණය සඳහා තෝරාගත් උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිරිවවුල, පමුණුව හා ගඩලාදෙණිය ප්‍රදේශයේ පාරම්පරික නවන්දන්නා කුලයේ පිත්තල ශිල්පීන් හමුවී සම්මුඛ සාකච්ඡා මගින් හා සහභාගීත්ව නිරීක්ෂණයෙන් සපයාගත් දත්ත මෙහිදී මූලික විය.

## අරමුණු

උක්ත පර්යේෂණය මූලික අරමුණු කිහිපයක් පෙරදැරිව සිදුකරන්නකි.ඒවා මෙසේ පෙළ ගැස්විය හැක.

- වර්තමාන සමාජ සංස්කෘතික විපර්යාස හමුවේ වියැකෙමින් පවතින නවන්දන්න කුලයේ පාරම්පරික පිත්තල කර්මාන්ත තුළින් හෙළිවන සිංහල සංස්කෘතියේ අනන්‍යතාව අධ්‍යයනය කිරීම හා සංරක්ෂණය මෙහි මුඛ්‍ය අරමුණ වේ.
- පාරම්පරික ශිල්පීන් විසින් පරපුරෙන් පරපුරට රැගෙන එන්නාවූ පිත්තල කර්මාන්තය හා බැදි බස්වහර, මෝස්තර රටා හා තාක්ෂණය පිළිබඳ සංස්කෘතික වටිනාකම හා වැදගත්කම අනාවරණය කරගනිමින් ඒ හා සම්බන්ධ දත්ත රැසකර සංරක්ෂණය කොට මතු පරපුර උදෙසා රැකගැනීම.
- පාරම්පරික පිත්තල කර්මාන්තය වර්තමානයේදී මුහුණ දී ඇති ගැටළු හා ඊට හේතු වූ කරුණු පිළිබද සොයා බැලීමත් ඒ සඳහා ගතහැකි ක්‍රියා මාර්ග කෙරෙහි අවධානය යොමුකිරීම.

## විමර්ශනය

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික හා පාරම්පරික කර්මාන්ත ක්ෂේත්‍රය තුළ පිත්තල කර්මාන්තයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. දුමින්දාගමනය සේවා නියුක්තිය පාදක කරගත් ක්‍රමවත් කුල සංවිධානයක් මෙරට බිහිවීමෙහි ලා මූලික වශයෙන් බලපෑබව පිළිගත හැකි කරුණකි. පිත්තල කර්මාන්තයද ඒ හා බද්ධ වූවක් බවට ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි සපයයි.

කුලයමත පදනම්ව මහනුවර අවධියේ බිහිවූ වැඩවසම් සමාජ ක්‍රමයේදී පිත්තල කාර්මිකයින් නවන්දන්නා කුලයට අයත් ලෝකුරු නම් උපකුලය කොට්ටල් බද්ද නම් දෙපාර්තමේන්තුව වශයෙන් සංවිධානය කරන ලදී. පිත්තල කර්මාන්තය හා සිංහල සමාජය අතර වූ සබැඳියාව සිංහල සංස්කෘතියේ අනන්‍යතාව තහවුරු කිරීමට සාධකයක් විය. ජාති, ආගම්, කුල හා පංති භේදයකින් තොරව ජීවිතයේ සාධනීය මෙන්ම නිශේධනීය වූ කුඩු මහත් සමාජ, දේශපාලන, ආගමික හා සංස්කෘතික කටයුතු කෙරෙහි පිත්තල ශිල්පීන්ගේ නිෂ්පාදන අතීතයේදී පමණක් නොව වර්තමානයේදීද එකසේ භාවිතයට ගැනීම සැලකිය යුත්තකි.

ඉතා වෙහෙසකර කටයුතු රාශියක නියැළීමෙන් පිත්තල කාර්මිකයින් තම භාණ්ඩ නිෂ්පාදනය සිදුකරන්නේ ඊටම ආවේණික වූ හා බද්ධ වූ කාර්මික ශිල්පීය ඥානයකිනි. ලෝහ සකස්කිරීම, ශිල්පීය උපකරණ සැකසීම, වාත්තුවැඩ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැකසීම හා සැපයීම, අච්චු සැකසීම, ආදී වූ අතුරු ක්‍රියා රැසක් මේ හා බද්ධ වීමෙන් පුළුල් රැකියා අවස්ථා සහිත සමාජ සංවිධානයක් බිහිවීම අතීතයේ සිටම පැවතීම සුළුකොට තැකියයුතු නොවේ.

සෑම බෞද්ධයකුගේම ගෞරව සම්ප්‍රයුක්ත භක්තියට පාදකවන්නාවූ දාගැබේ කොත නිර්මාණයේ සිට පැන්වඩන පැන් කෙණ්ඩිය නිර්මාණය දක්වා ජීවිතයේ කුඩුමහත් ක්‍රියාවන් සඳහා නවන්දන්නා සේවාව අගයමින් අතීතයේ රාජරාජමහාමාත්‍යයන්ගේ තෑගි බෝග මෙන්ම විශේෂ වරප්‍රසාද ලැබීමට හැකි වූ බව මූලාශ්‍ර අධ්‍යයනයෙන් මෙන්ම ඔවුන් හා කළ සම්මුඛ සාකච්ඡා තුළින්ද අනාවරණය විය.

නමුත් මෙකී පාරම්පරික පිත්තල කර්මාන්තය ශිල්පීය පක්ෂයෙන් මෙන්ම කලාත්මක පක්ෂයෙන්ද වර්තමානයේදී පරිහානියට පත්වීම සුළුකොට තැකිය යුතු නොවේ.නව වාණිජවාදී සමාජක්‍රමය හමුවේ පාරම්පරික ශිල්පීය ඥානයෙන් විනිර්මුක්තව වෙළඳපොළ පමණක් අරමුණු කරගනිමින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හේතුවෙන් පිත්තල කර්මාන්තය හා බැදි සිංහල සංස්කෘතියේ සුවිශේෂ අනන්‍යතා ලක්ෂණ රාශියක් සමාජයෙන් ගිලිහීයාම වර්තමානයේ දක්නට ලැබෙන අභාග්‍ය සම්පන්න ප්‍රවණතාවයි.

අතීතයේ මෙන්ම වර්තමානයේද පුළුල් සමාජ හා සංස්කෘතික මෙහෙවරක් සිදුකරන පිත්තල කර්මාන්තයේ නියැලෙන නවන්දන්නා කුලිකයන්ට සමාජ ස්ථරායනයේදී හීනකුල තත්ත්වයේ පිළිගැනීමක් ලැබීම උක්ත කර්මාන්තයේ හායනීයත්වයට තුඩු දෙමින් පවතින ප්‍රබල කරුණකි. කුල ස්ථරායනයේ අදුරු සෙවනැලි අද සමාජය තුළද අඛණ්ඩව පැවතීම තත් ශිල්පීන්ගේ හා නිෂ්පාදනයේ පරියානියට ප්‍රබලව බලපා ඇත.භාණ්ඩයන්ගේ ගුණාත්මක භාවය මෙන්ම දේශිය පාරම්පරික කලාත්මක මෝස්තර රටාවන්ගෙන් විනිර්මුක්තව අඩු කාලයකින් හා ශ්‍රමයකින් ගුණාත්මක හා කලාත්මක බවින් හීන පිත්තල භාණ්ඩ මහාපරිමාණයෙන් නිෂ්පාදනය කිරීමට ඇතැම් පුද්ගලයන් දරණ ප්‍රයත්නය හේතුවෙන් පාරම්පරික ශිල්පීන්ගේ කුසලතා පරිහානියට පත්වීම වැලැක්විය නොහැකි කරුණක්ව පවතී.

## නිගමනය

සංස්කෘතික සංස්පර්ෂය,විසරණය හා සංක්‍රමණ හේතුවෙන් දිනෙන් දින සිදුවන සමාජ සංස්කෘතික විපර්යාස හමුවේ සිංහල සංස්කෘතියේ අවිනෂ්ට ශේෂයන් වූ උඩරට නවන්දන්නා කුලයේ පාරම්පරික පිත්තල කර්මාන්තයෙන් හෙළිවන සිංහල සංස්කෘතියේ අනන්‍යතාව හා සංස්කෘතික හැඩතල සමාජයෙන් ගිලිහීයාමට ප්‍රථම හඳුනාගනිමින් එය සුරක්ෂිත කිරීමට යුහුසුලු වීම කාලීන අවශ්‍යතාවකි.

පාරම්පරික කර්මාන්තයේ නියැලෙන්නන් සංරක්ෂණ කිරීම හමුවේ දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ ඉලක්ක කරමින් උක්ත නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පාරම්පරික දේශීය සංස්කෘතියේ කලාත්මක හා නිර්මාණාත්මක පසුබිම ලෝකය හමුවේ අභිමානයෙන් කියාපෑමට මහගු අවස්ථාවක් සැලසෙන්නේය.එය සිංහල සංස්කෘතියේ අනන්‍යතාව ලෝකය හමුවේ තහවුරු කිරීමකි.එමෙන්ම මතු පරපුර සඳහා පාරම්පරික සම්ප්‍රදාය සුරක්ෂිත කිරීමකි.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


<u>සිංහල බෝධිවංශය</u>, තෙන්නකෝන් රැපියෙල් (සංස්), ශ්‍රී ලංකා ග්‍රන්ථ ප්‍රකාශන සමාගම, කොළඹ, 1964

කුමාරස්වාමි ආනන්ද කේ. මධ්‍යකාලීන සිංහල කලා, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, 1994

තිලකසිරි ජයදේව, ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්පී ගම් හා පාරම්පරික ශිල්පීන්ගෙන් පැවත එන පවුල් පිළිබඳ සමීක්ෂණයක්, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1994

පීරිස් රැල්ෆ්, සිංහල සමාජ සංවිධානය - මහනුවර, සී/ස (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 2008

සිල්වා එම්.යූ., ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය, අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ, මහර - කඩවත

සිල්වා කාලිංග ටියුඩර්, කුලය පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම්, සී/ස (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 2005

සෙනෙවිරත්න අනුරාධ, සංස්කෘතිය හා කලා ශිල්ප, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1997


### සම්මුඛ සාකච්ඡා

මැණික්බෝවේ සකලවල්ලි පටබැඳිගේ ගාමිණී මැණික්බෝව, 50/4, කරදපිටියවත්ත, කිරිවවුල, පිළිමතලාව

ඩබ්. ඩබ්. තිලක් විශ්වකුල, 107/B, කහඹේ, පිළිමතලාව, (සිරිකත බ්‍රාස්වෙයාර්)

කීර්ති නුවරපක්ෂ, 76, පමුණුව, පිළිමතලාව, ( නුවරපක්ෂ බ්‍රාස්වෙයාර්)

එස්.කේ. විමලසිරි, උපදේශක (තහඩු වැඩ) ජාතික මෝස්තර මධ්‍යස්ථානය, සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය, නත්තරම්පොත

ටී.ජී. ඥානතිලක, උපදේශක (වාත්තු වැඩ) ජාතික මෝස්තර මධ්‍යස්ථානය, සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය, නත්තරම්පොත

කේ.එච්. ලක්ෂ්මන් නිශාන්ත, 89/A, කහඹේ, පිළිමතලාව (දිමුතු පිත්තල භාණ්ඩ)

කිරිවවුල හිත්තර ගෙදර කරුණාරත්න, කිරිවවුල (ගල්අංග), පිළිමතලාව

දේවනාරායන හිත්තර ගෙදර ගාමිණී කරුණාරත්න, 79, කහඹේ, කිරිවවුල, පිළිමතලාව

කේ. මීගහකුඹුර, දේශීය බෞද්ධ කටයුතු කාර්යාංශයේ ලේකම්, දළදා මාළිගාව